සමාජ සේවා අමාත්‍යාංශය
சமூக சேவைகள் அமைச்சு
Ministry of Social Services

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders


මගේ අංකය / எனது இல. / My No. } NSE/EMA/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2012.05.31

චක්‍රලේඛ අංක : 02/2012

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## 2012 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

1. මහින්ද චින්තනය අනුව වයස අවුරුදු 70 ඉක්මවූ ශ්‍රී ලාංකික වැඩිහිටි පුරවැසියන්ගේ රැකවරණය හා සුභසාධනය සැලසීමේ අරමුණෙන් 2012 අයවැය යෝජනා යටතේ වැඩිහිටි සුභසාධන සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන්කර දීමට රජය විසින් තීරණය කර ඇත.

2. එබැවින් 2012.01.01 දිනට වයස අවුරුදු 70 ඉක්මවූ දැනටමත් මහජනාධාර / සමෘද්ධි ආධාර ලබන සියලුම වැඩිහිටි පුරවැසියන් සඳහා මසකට රු: 1,000/- වූ දීමනාවක් 2012 ජුනි 01 දින සිට ඔබේ නිර්දේශය අනුව රජයේ තැපැල් කාර්යාලයක පවත්වාගෙන යනු ලබන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් මගින් පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය.

3. ඔබ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසමට අදාල වැඩිහිටියන් වෙනුවෙන් රජයේ තැපැල් කාර්යාලයක පවත්වාගෙන යනු ලබන ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කළයුතු බැවින් එම බැංකුවෙන් නිකුත් කර ඇති පෝරම ඔවුන් ලවා පුරවා දෙවෙනි පිටුවේ නියමිත ස්ථානයේ ගණුදෙනුකරු ලවා අත්සන් කර මා වෙත ඉදිරිපත් කළයුතු වේ. (මෙම පෝරම තැපැල් කාර්යාල හෝ උප තැපැල් කාර්යාල මගින් ලබාගත හැකි වේ.) නිසමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර 2012.06.08 දිනට පෙර හෝ එදිනට මෙම කාර්යාලයට අතින් ගෙනවිත් භාරදීමට වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර / සමාජ සේවා නිලධාරි / සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්ට උපදෙස් දිය යුතුය.

4. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් හෝ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් නිකුත් කර ඇති හැඳුනුම්පත පරීක්ෂා කිරීමෙන් පුද්ගලයාගේ අනන්‍යතාවය හා වයස් සීමාව පිළිබඳව ඔබ සෑහීමකට පත්විය යුතු වේ.

5. ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති වැඩිහිටි ස්වාමිපුරුෂයා සහ භාර්යාව දෙදෙනාම දැනටමත් මහජනාධාර / සමෘද්ධි දීමනා ලබයි නම් ඒ බව හඳුනා ගැනීමෙන් අනතුරුව එම පවුල් ඒකකය වෙනුවෙන් එක් පුද්ගලයෙකුට පමණක් අදාල දීමනාව ගෙවීමට කටයුතු කළ යුතුය.


ලිපිනය | 150 A, එල්. එච්. පී. ගොඩනැගිල්ල, නාවල පාර, නුගේගොඩ.
முகவரி | 150 ஏ, எல். எச். பி. கட்டிடம், நாவல வீதி, நுகேகொட.
Address | 150 A, L. H. P. Building, Nawala Road, Nugegoda.
ඊ මේල්/ ஈ மெயில்/ E-mail : nsemss@sltnet.lk

දුරකථන / தொலைபேசி / Telephone :
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 2826749
කාර්යාලය / அலுவலகம் / Office : 2824082
ෆැක්ස් / பெக்ஸ் / Fax : 2826750

6. මෙම දීමනාව ලබමින් සිටි පුද්ගලයා යම් හෙයකින් මියගියහොත් එම දීමනාව මියගිය අයගේ, වයස අවුරුදු 70 ඉක්මවා ඇති කලත්‍රයාට ලබාදිය යුතුය. තවද මියගිය දිනට අදාල කලත්‍රයා වයස අවුරුදු 70 ඉක්මවා නොමැති නම් මෙම දීමනාව ලැබීමට පෙර ලබාගෙන ඇති සමෘද්ධි ආධාර / මහජනාධාර පෙර පරිදිම ලබාදිය යුතුය.

7. රු: 1,000/- දීමනාලාභියෙක් මියගියහොත් ඔහුගේ දීමනාව ලබා ගැනීමට නීත්‍යානුකූල හිමිකම්ලාභියෙන් නොමැත්තේ නම් ඔබ විසින් පවත්වාගෙන යනු ලබන පොරොත්තු ලේඛනයේ සුදුසුකම් ලබා ඇති ඊලඟ පුද්ගලයාට ලබාදිය යුතුය.

8. අදාල දීමනාලාභියෙකු මියගිය වහාම එම තොරතුරු ඉතා ඉක්මනින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට දන්වා එවීමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය.

9. රු: 1,000/- මාසික දීමනාව අදාල දීමනාලාභීන්ගේ ජාතික ඉතිරිකිරීමේ බැංකු ගිණුමට සෑම මසකම 10 වන දිනෙන් පසුව බැර කිරීමට මෙම කාර්යාලයෙන් කටයුතු කරන අතර, එම තොරතුරු අදාල මාසය තුළදීම ඔබ වෙත දන්වා එවීමට කටයුතු කරනු ඇත.

10. මෙම රු: 1,000/- දීමනාව ගෙවීමට හිමිකම් ලබන පුද්ගලයන්ට මෙතෙක් ගෙවන ලද අනෙකුත් සියලු දීමනා වහාම නවතා දැමීමට සුදුසු කටයුතු කල යුතුය.

මෙම දීමනාව පිළිබඳව වැඩිදුරටත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් දුරකථන අංකයන්ගෙන් විමසන්න.

දුරකථන - අධ්‍යක්ෂ - 011-2826749
වත්සලා මිය හෝ මෝහනදාස් මයා - 011-2824082 / 0718262982

ෆැක්ස් - 011-2826750

ඊ මේල් - dirnse@gmail.com / nsemss@gmail.com

ඉහත කාර්යයන් ඉටු කර ගැනීමේ දී ඔබ කාර්යාලයට අනුයුක්ත කර ඇති වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර / සමාජ සේවා නිලධාරී / සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්ගේ සම්පූර්ණ සහාය ලබා ගැනීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ

පිටපත් :

| | |
|---|---|
| සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්<br>සියලුම පලාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන් | ද.ගැ.ස හා අ.ක.ස |
| වැඩිහිටි හිමිකම ප්‍රවර්ධන සහකාර /<br>සමාජ සේවා නිලධාරී /<br>සමාජ සංවර්ධන සහකාර | මෙම කටයුත්ත සාර්ථක කර ගැනීමට ඔබේ සම්පූර්ණ සහයෝගය ලබා දීම සඳහා |